# සවියෙන් පෙරට - අපි එකට

## කලාප අධ්‍යාපන කාර්යාලය - හොරණ

## 10 ශ්‍රේණිය - බුද්ධ ධර්මය

## තුන්වන වාරය

## 21 පාඩම




# බෞද්ධ සාහිත්‍යය රස විඳිමු.

සැකසුම - දොන් පේද්‍රික් මහා විද්‍යාලය හොරණ

රූ රැසේ අඳින ලෙසේ අත් ළෙළ දිදි විදුලිය පබා
රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනු පා තබ තබා
කම් පසේ දෙන සර ලෙසේ දෙස බල බලා නෙතඟින් සබා
මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රඟ සුබා

**දරුවනේ ඉහත කවිය අපි රසවත්ව ගායනා කරමු. මේ කවිය ගයන්නේ සුසිල් ප්‍රේමරත්න කියන ගායකයා. වෑත්තෑවේ හිමියන් විසින් රචිත ගුත්තිල කාව්‍ය කියන පද්‍ය ග්‍රන්ථයේ තමයි මෙය ඇතුළත් වන්නේ.**

සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුග කිහිපයක් අපට මෙසේ දක්වන්නට පුළුවන්.

එනම්,

- අනුරාධපුර සාහිත්‍යය යුගය.
- පොළොන්නරු සාහිත්‍යය යුගය.
- දඹදෙනි සාහිත්‍යය යුගය.

# අනුරාධපුර සාහිත්‍යය යුගය

මෙරට ඉතිහාසයේ ආදීනම සාහිත්‍ය යුගය අනුරාධපුර යුගයයි. සියබස් ලකර මෙම යුගයට අයත් දැනට ශේෂ වී ඇති ග්‍රන්ථ වලින් එකකි. බෝසත් චරිතය හා බුද්ධ චරිතය මෙම සාහිත්‍යය කෘති වලට පදනම් කරගෙන තිබේ. මෙම යුගයේ රචනා වූ තවත් ග්‍රන්ථ කිහිපයක් නම්,

- සිඛ වළඳ හා සිඛ වළඳ විනිස
- ධම්පියා අටුවා ගැටපදය

මෙම යුගයේ පැරණිම පද්‍ය නිර්මාණ සීගිරි කැටපත් පවුරෙන් හමුවේ.

# පොළොන්නරු සාහිත්‍යය යුගය

පොළොන්නරු සාහිත්‍ය යුගයේ මෙරට සාහිත්‍යයට එක් වූ අගනා සාහිත්‍ය කෘති කිහිපයකි.

එනම්,

- අමා වතුර :- ගුරුළුගෝමී පඬිතුමා විසින් රචනා කරන පද මෙම කෘතිය පුරිසධම්ම සාරථී ගුණය ඇසුරින් ලියවුණකි.
- ධර්ම ප්‍රදීපිකාව :- පාලි බෝධි වංශය පදනම් කරගෙන ගුරුළුගෝමී පඬිතුමන් විසින් රචනා කරන ලදී.
- බුත්සරණ :- නව අරහාදී බුදුගුණ වර්ණනා කෙරෙන මෙය විද්‍යා චක්‍රවර්ති පඬිතුමා ලියන ලද්දකි.
- මුවදෙව්දාවත හා සසදාවත :- සිංහලයෙන් රචනා වූ පැරණිම ගී කාව්‍ය දෙකයි. මඛාදේව ජාතකය හා සස ජාතකය වස්තු විෂය වී ඇත. කතුවරයා සඳහන් නොවේ.

# දඹදෙණි සාහිත්‍ය යුගය

මෙම යුගය උසස් නිර්මාණ රැසක් හා උගත් ගිහි පැවිදි පඬිවරුන් කිහිපදෙනෙක් බිහි වූ යුගයක් ලෙස සැලකිය හැකිය. මෙම යුගයේ දී බිහිවූ සාහිත්‍ය ග්‍රන්ථ නම්,

- **පූජාවලිය** :- අරහං ගුණය තේමා කරගෙන ලියැවී ඇත. මයූරපාද පිරිවෙන්පති බුද්ධපුත්‍ර හිමිපානන් විසින් රචනා කරන ලදී.
- **සද්ධර්මරත්නාවලිය** :- ධර්මසේන හිමියන්ගේ නිර්මාණයකි. පාලි ධම්මපදට්ඨ කතාව ඇසුරු කරගෙන ලියැවී ඇත.

එසේම
- **දහම් සරණ**
- **සඟ සරණ**
- **කව් සිළුමිණ** මෙම යුගයට අයත් අනෙකුත් ග්‍රන්ථයන්ය.

සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍ය වන කව් සිළුමිණ ලියවුනේ මෙම යුගයේ දීය.

## ඇගයීම.

(1) i) සාහිත්‍ය යුග නම් කරන්න.

ii) එම යුගවලට අයත් ග්‍රන්ථ නම් කරන්න.

(2) සද්ධර්මරත්නාවලිය හා කව්සිළුමිණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

## පිළිතුරු.

(1) i)
- ✶ අනුරාධපුර යුගය
- ✶ පොළොන්නරු යුගය
- ✶ දඹදෙණි යුගය

ii)

| | | |
|---|---|---|
| ✶ අනුරාධපුර යුගය | :- | සියබස් ලකර<br>සිඛවළඳ හා සිඛවළඳ විනිස<br>ධම්පියා අටුවා ගැටපදය |
| ✶ පොළොන්නරු යුගය | :- | අමා වතුර<br>ධර්ම ප්‍රදීපිකාව<br>බුත්සරණ<br>මුවදෙව්දාවත , සසඳාවත |
| ✶ දඹදෙණි යුගය | :- | පූජාවලිය<br>සද්ධර්මරත්නාවලිය<br>සඟ සරණ, දහම් සරණ<br>කව්සිළුමිණ |

(2) ප්‍රශ්නයට පිළිතුරු

121 පිටුව බලන්න.
122 පිටුව බලන්න.